**පළාත් මට්ටමින් පෝෂණ මැදිහත්වීම් සඳහා වූ උතුරු පළාත් ව්‍යාපෘතිය- 2012**

---

3. **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ජේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර , මාගේ මතය වනුයේ ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්තවය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පුර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා වල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින් වලට අනුකූල වී ඇති බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.166,993,180 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.191,834,422 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම ඉකුත් වර්ෂයේ වියදම හා 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | | රු. | රු. |
| <u>01-සංරචකය</u> | | | |
| අතිරේක ආහාර සලාක සැපයීම | 96,080,089 | 150,000 | 96,230,089 |
| <u>02-සංරචකය</u> | | | |
| ධාරිතා ගොඩනැගීම හා ප්‍රජා සංචලීකරණය | 32,044,875 | 2,525,747 | 34,570,622 |
| <u>03-සංරචකය</u> | | | |
| ප්‍රජා පදනම් පෝෂණ මැදිහත්වීම | 36,697,964 | 22,027,729 | 58,725,693 |
| <u>04-සංරචකය</u> | | | |
| ව්‍යාපෘති අධීක්ෂණය, මෙහෙයවීම , ඇගයීම හා උපදෙස්දීම | 2,170,252 | 137,766 | 2,308,018 |
| | 166,993,180 | 24,841,242 | 191,834,422 |

## 2.2 අග්‍රිම අරමුදල් ගිණුම

මුල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවු තොරතුරු අනුව 2012 වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එදිනට ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 226,682 | 25,819,392 |
| එකතු කළා :- ඌනපුර්ණයන් | 1,700,000 | 220,190,000 |
| විදේශ විනිමය පාඩුව | - | (789,677) |
| | 1,926,682 | 245,220,315 |
| අඩු කළා - ආපසු ගැනීම් | 1,158,151 | 147,493,283 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 768,531 | 97,727,032 |

## 3. විගණන නිරීක්ෂණ

---------------------

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම හා අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ඉකුත් ගිණුම් කාල පරිච්ඡේදය සඳහා අනුරූපී සංඛ්‍යා මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඇ) 1989 ජුනි 16 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. තවද 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක , උපාංග හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

### 3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන පහත විෂයයන් එම එක් එක් විෂයයන් ඉදිරියෙන දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| --------- | ----------- | ------------------------ |
| | රු. | |
| දේශීය පුහුණු | 3,305,147 | ඇගැයීම් වාර්තා |
| උපදේශක සේවා | 654,600 | අවසන් වාර්තා |
| | ------------ | |
| | <u>3,959,747</u> | |

### 3.3 නීති , රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14 වගන්තිය ප්‍රකාර ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව රු.මිලියන 2.5 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට උපදේශක සමාගමක් තෝරා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් චර්යාත්මක වෙනස සන්නිවේදන උපදෙස් ලබාගැනීමට ඇති එකම ආයතනය සෞඛ්‍ය ප්‍රවර්ධන පදනම ( Health Promotion Foundation ) බවත් එම ආයතනයට එම අංශයේ වසර 15 ක අත් දැකීම් ඇති බවත් ව්‍යාපෘති අධ්‍යක්ෂ සඳහන් කර තිබුණි.

## 3.4 ව්‍යාපෘති කාර්යයන් ආරම්භ කිරීම

------------------------------------

2012 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන 48% ක් සම්පූර්ණ කර තිබුණද , ව්‍යාපෘතියෙ පහත දැක්වෙන කාර්යයන් 9 ක් 2013 මාර්තු 31 වන විටත් ආරම්භ කර නොතිබුණි. ඇස්තමේන්තු වටිනාකම රු.13,533,850 ක් වූ ව්‍යාපෘතියේ පහත සඳහන් කාර්යයන් 9 ආරම්භ නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | මුදල<br>------<br>රු. |
|---|---|
| II සංරචකය<br>------------- | |
| නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ මෙහෙයවීමෙන් දිස්ත්‍රික් මට්ටමින් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මට්ටමින් ප්‍රජා සහාය ( advocacy ) ලබාගැනීම සහ සංවේදීකරණ රැස්වීම් | 169,070 |
| ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් පවුල් සෞඛ්‍ය සේවිකාවන් සහ ප්‍රජා සෞඛ්‍ය පහසුකම් සපයන්නන්ගේ මෙහෙයවීමෙන් ප්‍රජා සහාය (advocacy ) ලබාගැනීම සහ සංවේදීකරණ රැස්වීම් | 596,640 |
| උපදේශක සේවා හඳුනා ගැනීම සහ කාන්තාවන් / ප්‍රජා කණ්ඩායම් ශක්තිමත් කිරීම | 9,999,550 |
| | -----------<br>10,765,260 |
| III සංරචකය<br>------------- | |
| විශේෂඥ පෝෂණ උපදේශක සන්නිවේදන සංවර්ධනය | 450,010 |
| පෝෂණ උපදේශක | 299,970 |
| ගෙවතු වගා ශිල්ප ක්‍රම / ආත්ම විශ්වාසය සඳහා ගෙවතු වගා | 418,550 |
| | ------------<br>1,168,530 |
| IV සංරචකය<br>------------- | |
| ව්‍යාපෘති අධීක්ෂණය හා මෙහෙයවීම සහ ඇගයීම් උපදේශක සහාය | 299,970 |
| මෙහෙයවීම පිළිබඳ වැඩ මුළු , ඇගයීම, හඳුනාගැනීම හා දර්ශක පිළිබඳ ගිවිසුම් සහ යාන්ත්‍රණය මෙහෙයවීම | 250,030 |
| ප්‍රාදේශීය මට්ටමින් වැඩමුළු | 1,050,060 |
| | -------------<br>1,600,060 |

**3.5 සැලසුම් කිරීම හා අධීක්ෂණය**

--------------------------------

නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කර ගැනීම සඳහා ප්‍රදාන ගිවිසුමේ 4 ඡේදය ප්‍රකාරව මූල්‍ය හා භෞතික ඉලක්ක ඉටුකර ගැනීමට මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් වගකීම් දක්වා සමස්ථ ව්‍යාපෘති කාල පරිච්ඡේදය සඳහා විස්තරාත්මක ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. අරමුදල් උපයෝජනය**

-----------------------

මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකිවූ තොරතුරු වලට අනුව, වර්ෂය සඳහා ලැබී තිබුණු රු.246,009,992 ක් වූ අරමුදල් වලින් සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති කාර්යයන් සඳහා රු.147,493,283 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණු අතර එය වෙන්කරන ලද අරමුදල් වලින් 60% ක් නියෝජනය විය.

**5. කාර්ය සාධන සමාලෝචනය**

-------------------------------

**5.1 ඉලක්කගත ගර්භණී හා කිරිදෙන මවුවරුන් සහ වයස අවුරුදු 2 කට අඩු ළමුන් සඳහා ආහාර සැපයීම ( ජීවපෝෂ )**

-----------------------------------------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලෝක බැංකු දූත කණ්ඩායමේ නිර්දේශය පරිදි ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල වල සහභාගීත්වය සහිතව දිස්ත්‍රික් මට්ටමින් අතිරේක ආහාර සඳහා ඉල්ලීම් හා ලැබීම් සඳහා ආකෘති පත්‍ර අනුගමනය කර නොතිබුණි. මෙය ක්‍රියාත්මක කර තිබුණද එය වාර්තාකරණය සඳහා වූ බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මේ සම්බන්ධයෙන් දන්වා තිබුණි.

(ආ) අතිරේක ආහාර ප්‍රතිලාභීන් සහ ඔවුන්ගේ පෝෂණ තත්ත්වය පිළිබඳව විස්තරාත්මක දත්ත පදනමක් සහිතව මෙහෙයුම් ක්‍රමයක් අතිරේක ආහාර සැපයීමේ ආරම්භයේ සිට ව්‍යාපෘතිය අනුගමනය කර නොතිබුණි. "මෙහෙයුම් සඳහා කලින් තිබූ ආකෘතිය අදාල නොවන බැවින් මෙහෙයුම් හා ඇගයීම් සාමාජිකයන් සමඟ සාකච්ඡා කරන ලද පරිදි ආකෘතිය වෙනස් කර දැනට නව ආකෘතියක් භාවිතා කරන බව " මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා දනවා තිබුණි.

**5.2 සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා උතුරු පළාතට උපදේශක සේවා සැපයීම - රු.654,000**

ඉහත කාර්යය සඳහා 2012 වර්ෂයේ රු.2,523,000 ක අතිරේක මුදලක් වෙන්කර තිබුණද , රු.654,600ක් පමණක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුහුණු මොඩියුලයේ " අ" ඇමුණුම ප්‍රකාරව පුහුණුකිරීම් සිදුකර නොතිබුණි.

(ආ) කාර්ය සාධනය සමාලෝචනය සඳහා පවත්වන ලද රැස්වීම් 4 කට උපදේශකවරුන් සහභාගී වී නොතිබුණු අතර ඉල්ලීම පරිදි 2012 ජූලි පැවැත්විය යුතු ප්‍රදර්ශනය සම්පාදනය කර නොතිබුණි.

(ඇ) කාර්තුමය වාර්තා ලබාගැනීමෙන් තොරව උපදේශකවරයාට ගෙවීම් කර තිබුණි. යොමු ගත කොන්දේසි ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ යුතු කාර්තුමය වාර්තා 4 කින් එක් වාර්තාවක් පමණක් උපදේශක විසින් ඉදිරිපත් කර තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් ගිවිසුමේ දක්වා ඇති පරිදි රක්ෂණ ආවරණය උපදේශක විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) උපදේශක විසින් මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක වල ක්ෂේත්‍ර චාරිකා සිදුකර නොතිබුණි. අදාල වෘත්තියේ හිඟකම හේතුවෙන් මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්ක සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන පහසුකම් සපයන්නන් ( Health Promotion Facilitators ) උපදේශක විසින් පත්කර නොතිබු බව හා දිස්ත්‍රික්ක 5 තුළම ව්‍යාපෘතියට අදාල කාර්යය මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (MOMCH) හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි ( MOH) මඟින් සම්පූර්ණ කරනු බව මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දක්වා තිබුණි.

**5.3 ප්‍රසම්පාදන පර්පාටිය**

(අ) උතුරු පළාත් සභාවේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2012 දෙසැම්බර් 13 දිනැති අංක පේඑස්ඩීඑෆ්/ එන්යූටී / එන්පී / භාණ්ඩ / 13 දරන ලිපියට අනුව , 2012 දෙසැම්බර් 31 දක්වා තරාදි කිහිපයක් ප්‍රවාහනය කර නොතිබුණු අතර අවශ්‍ය සවි කිරීම් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වටිනාකම රු.6,645,532 ක් වු ඉහත තරාදි දීමේ අරමුණු මෙතෙක් ඉටුකර ගෙන නොතිබුණි. උස හා බර මැනීමේ උපකරණ ඉලක්කගත ස්ථානයේ තබාගත හැකි වු ඉඩ ප්‍රමාණය හා ප්‍රවාහන පහසුකම් ලබාගැනීමට නොහැකිවීම හේතුවෙන් කාල රාමුව තුළ ප්‍රවාහනය කිරීමට නොහැකි වු බවත් මෙම උපකරණ අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය තාක්ෂණ නිලධාරිගේ අධීක්ෂණය යටතේ දැනට නිශ්චිත ස්ථානයේ සවිකර ඇති බවත් මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ දන්වා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන තීරණය වන ලංසු 05 කට අඩු නොවන සංඛ්‍යාවක් ලබාගැනීම වෙනුවට ලංසු තුනක් පමණක් ලබාගනිමින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.14.1 වගන්තියට පටහැනිව බජාජ් ඩිස්කවර් 150 වර්ගයේ යතුරු පැදි 06 ක් හා TVS ස්කූටි පෙප් ( TVS Scooty Pept ) වර්ගයේ යතුරු පැදි 02 ක් රු.1,683,400 ක වටිනාකමකට ප්‍රසම්පාදනය කර තිබුණි.

| **විෂයය** | **වටිනාකම** |
|---|---|
| | රු. |
| බජාජ් ඩිස්කවර් 150 වර්ගයේ 6 ක් | 1,287,600 |
| TVS ස්කූටි පෙප්ට් වර්ගයේ 2 ක් | 395,800 |
| | 1,683,400 |

(ඇ) මව් සමාජයන්ට ආධාර කිරීමට ලෝක බැංකුව නිර්දේශ කර තිබුණද , සංරචක 3 යටතේ මව් සමාජයන් සඳහා එක් ප්‍රසම්පාදනයක හෝ සපයා නොතිබුණි.

## 5.4 වත්කම් කළමනාකරණය

වැඩිහිටියන් සඳහා බර කිරුම් තරාදි 100 ක් හා ළමුන් සඳහා කිරුම් තරාදි 80 ක් 2012 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය හඳුන්වා නොදීම හේතුවෙන් උතුරු පළාතේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වල 2012 නොවැම්බර් සිට නිෂ්කාර්යව තිබෙන්නට ඉඩහැර තිබුණි. ප්‍රතිලාභීන් තෝරා ගැනීමෙන් පසු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වලට ඉහත බර කිරුම් තරාදි බෙදා හරින බව 2013 පෙබරවාරි 22 සිදුකරන විගණන පරීක්ෂණ අවස්ථාවේදී දනවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| | **වැඩිහිටි** | **ළමා** |
|---|---|---|
| යාපනය | 17 | 14 |
| කිලිනොච්චිය | 24 | 18 |
| වවුනියාව | 17 | 14 |
| මුලතිව් | 24 | 18 |
| මන්නාරම | 18 | 16 |
| | 100 | 80 |

## 6. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ප්‍රසම්පාදන

(ඇ) උපදේශක සේවා